බලනු ඇතැයි යන අපේක්ෂාවෙන් අනුරාධ නැවතී බලා සිටියේ ය. එනමුදු නිෂාධි ඔහු දෙස නැවත නොබලා ම වාහන පෙළ අතර සැඟව ගියා ය.

අනුරාධ අපසු වාහනය වෙත ආවේ කල්පනාවෙන් බරව ගිය සිතිනි. මොකක්දෝ නොතේරෙන හැඟීමකින් ඔහු සිත නොසන්සුන්ව තිබුණි. අනන්ත අප්‍රමාණ තරුණියන්ගේ ආකර්ශණයට ලක්ව සිටින තමා එක් නිමේෂයකදී හමුවුණ නන්නාඳුනනා තරුණියක නිසා කැළඹීමට පත්ව සිටීම ඔහුට ද වටහා ගත නොහැකි කාරණයක් විය. ඈ අවසන් වතාවට පෑ පියකරු සිනාව ඔහුගේ සිත තුළ නොමැකෙන ලෙස ඇඳී තිබුණි. එය සරුවපිත්තල නිළියකගේ ව්‍යාජ සිනාවකට වඩා කොයි තරම් පිවිතුරු දැයි අනුරාධ සිතුවේ ය.

ඔහු ලෝකාන්තයේ සිට නුවරඑළිය දක්වා වාහනය පදවාගෙන ආවේ වෙන කිසිමදාකට වඩා පරිස්සමිනි.



00000000

"අපි හිතුවේ උඹ ලෝකාන්තයෙන් පහළට වත් පැන්නද කියලා.." නිෂාධි දුටු වහා ම පවිත්‍රා කෑ ගසා කීවා ය. ".. ඒත් මම මේ අනුරට කිය කියා හිටියෙ ආපහු ගිහින් බලමුද කියලයි..."

"පැන්න නම් ඉතින් බලන්න වෙන්නෙ බලංගොඩ දි තමයි.. ඒ නිසා මං මෙයාට කිව්වා ඔන්න ඔහේ එනවද කියලා බලාගෙන ඉඳිමු කියලා.." අනුර කීවේ ය.

නිෂාධි සිනාසුණා ය.

"කොයි තරම් ප්‍රශ්ණ ආවත් සිය දිවි නසාගන්න තරම් දුර්වල නැහැ මම.." ඇය කීවා ය.

"හරි.. හරී... ඔයිට වඩා කයිවා රූ ගහපු හස්තිරාජයොත් බිමට වැටෙන දවස් තිබ්බා නංගී.." අනුර තීවේ නිෂාධිට නගින්නට වාහනයේ පිටුපස දොර අරින අතරදී ය. පවිත්‍රා තමා අත වූ තුවාය නිෂාධි වෙත විසි කළා ය.

"පුදුමයි මෙච්චර ලොකු වැස්සකටවත් උඹේ කොණ්ඩෙ තෙමිල නෑ..."
"මාව නොතෙමී එක්කගෙන එන්න හරියටම වැස්ස එන්න මොහොතකට කලින් දෙවියො හොඳ කඩවසම් කොල්ලෙක් එව්වා කුඩේකුත් දීලා... "

"වැඩේමයි... හීනයක් දකින්න ඇති.."
"නෑ.. නෑ.. ඇත්තමයි මං කිව්වෙ.. දන්නවද එයාගෙ නම.. ?"
"ඔය කිව්වා වගේ ඒ ටිකත් කියපංකො තෙපරබාන්නෙ නැතිව.."
"අනුරාධ... අනුරාධ කීර්ති බණ්ඩාර..."

"මොකක්... මොකක්ද කිව්වෙ නම..?" පවිත්‍රා ඉදිරි ආසන දෙක අතර වූ ඉඩෙන් වහා නිෂාධි දෙස එබී බැළුවා ය.

"අනුරාධ කීර්තිබණ්ඩාර.." නිෂාධි නැවත කීවා ය.

"විහිලු කරන්න එපා.. අනුරාධ කොහොමද මෙහෙ ඉන්නෙ..?"
"මං දන්නෙ කොහොමද..? ඇයි උඹ එයාව අඳුනනවද..?"

"මං විතරක් නෙවෙයි.. මුළු ලංකාවම දන්නවා..."
"අනුරාධව...?"
"ඔව්.. ඇයි උඹ දන්නෙ නැද්ද..?"

"මං කොහොමද දන්නෙ...? අදමයි දැක්කෙත්.. අදමයි නම ඇහුවෙත්..."

"අනේ දෙයියනේ උඹ ඔස්ට්‍රේලියාවෙද හිටියෙ එහෙම නැත්නම් සයිබීරියාවෙද..? අවුරුද්දකට සැරයක්වත් ෆිල්ම් එකක් ටෙලි නාට්‍යයක් බලන්නෙවත් නැද්ද උඹලා...?"

"දිලීප ඒවට කැමති නැහැ පවිත්‍රා.." නිෂාධි සුසුමක් හෙලුවා ය. "...උඹ දන්නවනෙ දිලීපගෙ හැටි. විශ්වාස කරන්න අපි කවදාවත් මියුසිකල් ෂෝ එකකටවත් ගිහින් නැහැ.. "

"අනේ දෙයියනේ.." පවිත්‍රා විස්සෝප වූවා ය.
"දිලීප කැමති නැහැ ලංකාවෙ මිනිස්සු ගැවසෙන තැන් වලට යන්න.. එයාට ලංකාවෙ මිනිස්සු අරහං.. "

"හොඳ වෙලාවට එහෙනං එයා මේ පාර උඹත් එක්ක ලංකාවට ආවෙ නැත්තෙ.. ආවනං මෙහෙම ගමනක් වත් උඹව එවන එකක් නැහැ.. "

***නිෂාධි සිනාසී සාලයේ දකුණු පස කෙළවරේ සැප පුටුවක වාඩි වූවා ය. ටීපෝව මත වූ දුරස්ත පාලකය ගෙන ඉදිරියේ තබා ඇති රූපවාහිණිය ක්‍රියාත්මක කළා හ.***

නිෂාධි පිලිතුරක් නොදුන්නා ය. නුවරඑළියට පැමිණෙන තෙක්ම තිදෙනා අතර සංවාදයක් නොවී ය.

"මට නම් දැං යකෙක් කන්න තරම් බඩගිනියි..." වාහනය හෝටලයට හරවන අතර අනුර නිහඬතාව බිඳ දමමින් කිවේ ය.

"මටත් බඩගිණියි.." පවිත්‍රාද කීවාය. නිෂාධිට ද බඩගින්නක් දැනෙමින් තිබුණි. එනමුදු ඇය කිසිවක් නොකීවා ය.

"මොකද උඹ කතා නැත්තෙ..? පිවිත්‍රා ඇසුවේ එනිසා ය. ... මොකද.. තාමත් අනුරාධ ගැන සිහිනයක ද?"

"අනුරාධ...? ඉතින් උඹ මට තාම කිව්වෙ නැහැනෙ අනුරාධ කව්ද කියලා.." වාහනයෙන් බසින අතර නිෂාධි ඇසුවා ය.
"අනුරාධ කව්ද කියලා උඹම හොයා ගනින්.." පවිත්‍රා සිනාසුණා ය. අනුරාධ කව්දැයි නැවත නැවත යෙහෙළියගෙන් අසන්නට නිෂාධි නොවෙහෙසුණා ය.

සිය කාමරයට ගිය වහාම නිෂාධි නාන කාමරයට වැදී ඇති තරම් නා ගත්තා ය. දවසේ විඩාව සේදී යන තෙක්ම වතුර මලට හිස අල්ලාගෙන සිටියා ය. සැහැල්ලු ගවුමක් ඇඟලා ගත් ඇය කැඩපත ඉදිරියේ විනාඩි කීපයක් ගතකොට කොණ්ඩය ද වියලාගත්තා ය. ඇය පවිත්‍රාත් අනුරත් එනතෙක් නොසිට ම පඩි පෙළ බැස පහත මාලයට ආවා ය.

පහත මාලයේ වම්පස ඈත කෙළවරේ කාමර පේළිය දෙසින් ගී හඬක් ඇසෙයි. එකිනෙකා පරයා කෑ කෝ ගසන හඬක් ද ඇසෙයි.

"සොරි මැඩම්.. අද හෝටලේට ෆිල්ම් කට්ටියක් ඇවිත්... ඒකයි ගෝසාව.. කරදරයක් නම් සමාවෙන්න.." නිෂාධි ෂෝෂාව පිළිබඳව විමසිළිමත් වනු දුටු පිලිගැනීමේ කවුන්ටරයේ සිටි තරුණිය කීවා ය.
"කමක් නෑ සඳමාලි... ඒ අයත් සන්තෝස වෙන්න ඕනෙන..." නිෂාධි කීවා ය. "....ඔයාට පුලුවන් නම් මට කෝපි එකක් එවන්න.."

නිෂාධි සිනාසී සාලයේ දකුණු පස කෙළවරේ සැප පුටුවක වාඩි වූවා ය. ටීපෝව මත වූ දුරස්ත පාලකය ගෙන ඉදිරියේ තබා ඇති රූපවාහිණිය ක්‍රියාත්මක කළා හ. රාත්‍රී ප්‍රවෘත්ති විකාශය අවසන්වෙමින් තිබෙන බව ඇය දුටුවා ය. අනතුරුව වැළක් මෙන් එක දිගට ප්‍රචාරය වූ වෙළඳ දැන්වීම් දෙස ඇය බලාසිටියේ උදාසීනව ය. දැඩි අලස බවක් දැනෙයි. නිෂාධි දෑස් පියාගෙන කල්පනාවට වැටුණා ය. ඈ සිය ඉරියව්ව වෙනස් කළේ එකවරම ඇසුණ සුපුරුදු කටහඬක් නිසා ය.

රූපවාහිනී තිරය මත සටහන්ව තිබූ රුව නිෂාධි වහා අඳුනාගත්තා ය. අනුරාධ... මේ ඔහු ද..?

"ලස්සන කතාව නේද මිස්..?" නිෂාධි ඉදිරියේ කෝපි කෝප්පය සහිත බන්දේසිය තබමින් සිටි සඳමාලි ඇසුවා ය. ".. මෙතන වැඩ නිසා මට හැමදාම ඔය කතාව හරියට බලන්න බැරිවෙනවා.."

"අර ඇක්ටගෙ නම මොකක් ද සඳමාලි..?" නිෂාධි ඇසුවා ය. තරුණිය නිෂාධි දෙස බැලුවේ පුදුමයෙනි.

"ඇයි මිස්.? ඔයා දන්නෙ නැද්ද..?"

"මං.. මං හුඟක් කල් පිටරට හිටියෙ..."

"ඒක තමයි.. මං පුදුම වුණා.. එයාගෙ නම අනුරාධ.. හරිම දක්ෂයි.. හරිම ජනප්‍රියයි.."

අනුරාධ.. අනුරාධ කීර්තිබණ්ඩාර.... මෙයට පැය කීපයකට පෙර තමා වැස්සෙන් කෙමෙන්නට නොදී කුඩයක් අල්ලාගෙන සිටියේ ඔහුම නොවේ ද..? ඔහුගේ හැසිරීම තුළ වූ විනීත හා නිහතමානී බව කොයි තරම් සිත් ඇද බැඳ ගන්නා සුලු වී ද..? තරුණ සිත් වසඟයට ගත් කඩවසම් නලුවෙකු වෙතින් ඒ තරම් සංයමයක් බලාපොරොත්තු විය හැකි ද?

නිෂාධි කෝපි කෝප්පය තොල ගාමින් නාට්‍යයේ කතාව තේරුම් ගන්නට උත්සාහ කරමින් සිටියා ය. ටෙලි නාට්‍යය දෙස තවත් බලා සිටීමට අපහසු බවක් ඇයට දැනුණි.

00000000

සිය සගයන්ගේ කාමර වලින් ඇදී එන ෂෝෂාව අනුරාධ ට මහා වදයක් විය. ඔහු ඇඳෙන් නැගිට අලුත් කමිසයක් අග්තේ ය.

"මොකද..? සද්දෙ වැඩි ද?" අලස ලෙස ඇඳේ වැතිරී සිටි සුනෙත් හිස ඔසවා බලා ඇසුවේ ය.
"මුංගෙ ගාලගෝට්ටිය මට හරිම වදයක්..බං.... මං යනවා එළියට...ටිකක් නිස්කාංසුවේ ඉන්න..."

"පලයන් .. පලයන්.. මං බලාගෙන හවස ආව වෙලේ ඉඳන් වෙනම ලෝකෙක ඉන්න හැටි... නිස්කාංසුවේ කල්පනා කරන්න තවත් දේවල් ඇතිනෙ ඉතුරුවෙලා.."

"ඔන්න.. ඔන්න.. කඩි එකක් ගහන්න පොටක් පාදාගන්න බලනවා.. මං යනවා.." අනුරාධ කාමරයෙන් පිටවුයේ ය.

පිළිගැනීමේ කවුන්ටරයේ සිටි සඳමාලි මහත් ඕනෑ කමකින් ඔහු හා සිනාසුණා ය.

"සර් දන්නවද පුදුම වැඩක්...?" ඇය ඇසුවා ය.
"පුදුම වැඩක්.. මොකක්ද අප්පේ ඒ?" අනුරාධ කවුන්ටරය අසළ මොහොතකට නැවතුණෝ ය.

"සර්ව අඳුනන්නෙ නැති මිස් කෙනෙක් මට දැන් හමුවුණා නෙ..."
"මටත් එහෙම කෙනෙක් අද දවාලෙත් හමුවුණා.. ලෝකාන්තෙදි..... බලගෙන යනකොට අපි ඒ හැටි ලොකු මිනිස්සු නෙවෙයි නංගි.. .."

"හැබැයි මට දැන් කතා කළ මිස් නම් දැන් සර්ව අඳුනනවා.. අර සර් රඟපාන කල්පාන්තය ටෙලිනාට්‍යය දැන් ටීවී එකේ යනවා.. ඒ මිස් සර්ව පෙන්නලා මගෙන් ඇහුවා ඒ කවුද කියලා.. ඉතින් මං කියලා දුන්නා.."

අනුරාධ කවුන්ටරය අසළ සිට සාලයේ ඈත කෙළවරේ තමාට පිටුපා රූපවාහිණිය ඉදිරියේ වාඩි වී සිටිනා තරුණිය දෙස බැලුවේ ය. එතැනට ගොස් රූපවාහිණිය නරඹන්නට කැමැත්තක් ඇති වුව ද ඇයට බාදා නොකළ යුතු යයි ඔහු සිතුවේ ය.

"මං ගාඩ්න් එකට යනවා නංගි.. මට එතෙන්ට බියර් එකක් එවන්න.."

ළබන කලාපයට


**කාන්ති වික්‍රමසූරිය ගේ**

ආත්මයෙන් ආත්මයට නවකතාව නිකුත් වෙයි




පිටකවරය ජගත් ජේ එදිරිසිංහ

සන්නස ට නිතර ලිපි ලියන කාන්ති වික්‍රමසූරිය ලේඛිකාව ගේ කුලුඳුල් නවකතාව "ආත්මයෙන් ආත්මයට" පසුගිය දා ශ්‍රී ලංකාවේ දී එළි දැකිවුණි

රාධි කල්හාරි වීරසූරිය හා භානු රංග දේවරාජ් අතර ඇතිවන ආදරය පිළිබඳව ලියැවුණ ආත්මයෙන් ආත්මයට නවකතාව එක හුස්මට කියවා නිම කළ හැකි රසවත් කතාවකි.